www.kidworship.kr

# දාවිත් සහ ජොනතන්

– 23rd Story–


165Page

**පොතේ ගුරා** — දාවිත් පිලිස්ති මල්ලව ගොලියොත්ව පරාජය කළ පත් කළාට පසුව සාවුල් රාජ මන්දිරයේ ඉන්නට දාවිත්ට කතා කළා.සාවුල් රජුට ජොනතන් නම් පුත්‍රයෙකු සිටියා. ජොනතන් දාවිත්ගේ වීර දක්‍ෂකම් වලට ගොඩාක් ප්‍රිය කළා.  එසේ ජොනතන් සහ දාවිත් ඉතාම හොඳ මිතුරන් බවට පත් වුණා.

**ජොනතන්** — (ජොනතන් දවසක් දාවිත්ට කිව්වා)
" මාගේ මිත්‍රය, දාවිත්, දැන් ඔයා මගේ හොඳම යාළුවා. කරුණාකරලා මේ ත්‍යාගය ගන්න "

**පොතේ ගුරා** — ජොනතන් ඔයාගේ රාජකීය වස්ත්‍රය ගෙන දාවිත්ට එය දුන්නා.
එසේම ඔහුගේ කඩුවත්, දුන්නත්, ඉගපටියත් දාවිත්ට පවරා දුන්නා.

**ජොනතන්** — අපි දෙන්නම දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අපි දෙන්නට ප්‍රේම කරමු.

**දාවිත්** — ඔව් ඇත්තටම.

**පොතේ ගුරා** — ජොනතන් හා දාවිත් එකිනෙකාට ඇළුම්වන ඉතාම උතුම් මිත්‍රයන් බවට පත් වුණා. හොඳ මිතුරන් වශයෙන් ඔවුන් එකිනෙකාගේ අවශ්‍යතා වෙනුවෙන් සැළකිලිමක්ව සිටින මිතුරන් බවට පත් වුණා.

................................................................................


166Page

**පොතේ ගුරා** — එක් දවසක් සාවුල් රජතුමා, දාවිත් සමඟ යුද්ධයක් නිම වී ආපසු එනවිට පාරේ සිටි ජනතාව ගයමින්, වයමින්, නටමින් ශබ්ද නගා ප්‍රශංසාත්මකව ඇගයීමක් කළා.

**ජනතාව** — සාවුල් රජ තෙමේ දහසක් මැරිය........  දාවිත් දස දහසක් මැරිය......

**පොතේ ගුරා** — සාවුල් රජු මෙය ඇසුවාම තද කෝපයට පත් වුණා.


**සාවුල් රජු** — මිනිසුන් දාවිත්ව සළකන්නේ ඉතාමත් ඥානවන්ත සහ නිර්භිත පුද්ගලයකු හැටියටයි. මම දැන් මොකද කරන්නේ ?
මගෙන් පසුව රජකම දාවිත්ට ලැබුණොත් කුමක් වෙයිද? මේක වෙන්න බෑ. ඉශ්‍රායෙල්ට රජ මම විතරයි. මගෙන් පසු රාජ සිංහාසනයට ඒමට ඕන, මගේ පුතා ජොනතන්.

................................................................................


167Page

**පොතේ ගුරා** — කෙසේ වුවද සාවුල් නිතර කනස්සලුව සිටියා. රජු කනස්සලුව සිටින වෙලාවට දාවිත් පැමිණ ගායනයෙන් හා වීණාව වාදනයෙන් රජුව සන්සුන් කළා. මෙයින් සාවුල්ගේ මනස යහපත් තත්වයකට පත් වුණා.
නමුත් ඒක වරින්වර වෙනස් වුණා. එක් වෙලාවකදී දාවිත් වීණාව වයමින් සිටිය දී කෝපයට පත් රජු දාවිත්ට විදින්ට අණිමියි, සිතා හෙල්ලයක් දාවිත් දෙසට විසි කළා.
දාවිත් ක්‍ෂණයකින් ඉවතට පැන්න නිසා ඔහු එදා බේරුණා.

................................................................................


168Page

**දාවිත්** — සාවුල් රජතුමා මට මෙහෙම කරන්නේ ඇයි .... ?


**පොතේ ගුරා** — සාවුල් රජු මෙසේ කරන්නේ මන්දැයි දාවිත් ඇත්තටම දැන සිටියේ නෑ. ජනතාව දාවිත්ට දක්වන කැමැත්ත, ප්‍රියමනාපත්වය දකින සාවුල් රජු, වඩ වඩා දාවිත්ට වෛර කරන්නට පටන් ගත්තා.
මේ නිසා සාවුල් රජුට අවශ්‍ය වුයේ දාවිත්ව මරා දැමීමටයි.




169Page



170Page



171Page



172Page

| | |
|---|---|
| පොතෙ ගුරා | නමුත් මේ සම්බන්ධව දැනගත් ජොනතන් ඉතාමත් කණගාටුවකට පත් වුණා. ඔහු තම ශක්තිය උපදවාගෙන තම පියාණන් වූ සාවුල් රජුට කතා කරන්නට ගියා. |
| ජොනතන් | තාත්තේ... මගේ මිත්‍රයා දාවිත්ව මරන්නට සැලසුම් කරන්නේ ඇයි ?<br>ඔහු ගොලියොත් පවා පරාජය කළේ නැද්ද ?<br>ඔහු ශක්තිමත් විශ්වාසවන්ත සේවකයෙක් නේද? |
| පොතෙ ගුරා | මෙය ඇසූ සාවුල් ලැජ්ජාවට පත් වුණා.<br>ඔහු ජොනතන්ට පොරොන්දුවක් වුණා. |
| සාවුල් රජු | ඔබ හරි. මම ආයෙත් දාවිත් මරන්නට වැඩ කරන්නේ නෑ. |

---

| | |
|---|---|
| පොතේ ගුරා | නමුත් තවත් දවසක දී දාවිත් තම වීණාව වාදනය කරමින් සිටිය දී සාවුල් නැවතත් දාවිත්ට හෙල්ලය විසි කළා. දාවිත් මේ හේතුවෙන් එදින රාත්‍රියේම එතැනින් පලා ගියා. රජු දාවිත් පැනගිය බව දැනගත්තා. |
| සාවුල් රජු | දාවිත් කොහේද ? |
| මිනිසා | " ඔහු කොහේදෝ දුවලා ගියා. " |
| පොතේ ගුරා | ජොනතන්, දාවිත්ට උදව් කරනවාට සාවුල් රජු ඉතා අකමැතිව සිටියා. ඔහු වෛරයෙන්ම පිරී සිටියා. මේ නිසා සාවුල් රජ සොල්දාදුවෙකුට කතා කොට දාවිත් පසුපස යන්නැයි කීවා. |
| සාවුල් | දාවිත් කොහේද? ඔහුගේ පස්සෙන් යන්න. ඉක්මනින්ම ඔහුව අල්ලාගෙන එන්න, මට ඔහුව මරන්න ඕන. |

---

| | |
|---|---|
| පොතෙ ගුරා | සාවුල් රජ දාවිත්ව මරන්නට සැලසුම් කරන විටදී ඒ බව දැනගත් ජොනතන් දාවිත්ව විශාල පර්වතයක් තුළ සැඟෙව්වා. |
| දාවිත් | ජොනතන්, ඔයාගේ පියා මාව මරන්න හදන්නේ ඇයි ? මම කළ වැරැද්ද මොකක් ද ? |
| ජොනතන් | දාවිත් ඔයා මැරෙන්නේ නෑ. මගේ පියා උත්සහ කළත් ඔයා මැරෙන්නේ නෑ. මම ඔයාට උදව් කරනවා මෙයින් පලායන්නට. |
| පොතෙ ගුරා | සාවුල් රජු, දාවිත්ට කොපමණ වෛරය කළත් දාවිත් ජොනතන්ට වෛර කළේ නෑ. ජොනතන් දාවිත් සමඟම හැංගෙන ස්ථානය බලා පිටත්ව ගියා. එහි ජොනතන් දාවිත් සමඟ කතා කළා. |
| ජොනතන් | දාවිත්, මගේ පියා ඔයාව ඇත්තටම මරන්නට කුමන්ත්‍රණය කරනවා. ඒ නිසා ඔබ දැන් පලා යා යුතු වෙනවා. |

---

| | |
|---|---|
| පොතෙ ගුරා | එවිට දාවිත් ජොනතන්ව සිප වැළඳගෙන හැඩුවා. ඔවුන් දෙදෙනාම වෙන්වී යන මොහොත පැමිණියා. නමුත් අවසානයේ දී ඔවුන් නැවත මතක් කළේ " අපි දෙදෙනාම අන්තිම වෙනතුරුම හොඳම හොඳ මිතුරන් විදිහට සිටිය යුතු බවයි " |

---

| | |
|---|---|
| ජිවිතයට අදාල කිරිම | දෙවියන්වහන්සේ අපිට ගොඩාක් ආදරෙයි. ඒ නිසා අපිව විනාශ කරන්න කාටවත් බෑ. අපේ උදව්වට උන්වහන්සේම අපිට මිතුරන් ලබා දෙනවා. විශ්වාසවන්ත මිතුරන් අපිව ආරක්ෂා කරගන්නවා.<br>ඔබට දී ඇති විශ්වාසවන්ත මිතුරන් ගැන දෙවිපියාණන්වහන්සේට ස්තුති කරන්න. |